ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA

**සන්නිවේදන දෙපාර්තමේන්තුව**
30, ජනාධිපති මාවත, කොළඹ 01, ශ්‍රී ලංකාව
දුරකථන අංක: 2477424, 2477423, 2477311
ෆැක්ස්: 2346257, 2477739
ඊ-මේල්: dcommunications@cbsl.lk, communications@cbsl.lk
වෙබ් අඩවිය: www.cbsl.gov.lk

# පුවත්පත් නිවේදනය

| නිකුත් කළේ | සංඛ්‍යාන දෙපාර්තමේන්තුව |
|---|---|
| දිනය | 2019 සැප්තැම්බර් 04 |

## ඉඩම් මිල දර්ශකය - 2019 වසරේ පළමු භාගය

ශ්‍රී ලංකා මහ බැංකුව විසින් කොළඹ දිස්ත්‍රික්කය ආවරණය කරමින් අර්ධ වාර්ෂිකව ගණනය කරනු ලබන ඉඩම් මිල දර්ශකය, 2019 වසරේ පළමු භාගය සඳහා 132.2 ක අගයක් වාර්තා කරන ලද අතර, එය 2018 වසරේ පළමු භාගයේ වාර්තා වූ අගයට සාපේක්ෂව සියයට 13.6 ක වර්ධනයකි. ඉඩම් මිල දර්ශකයේ නේවාසික, වාණිජ හා කාර්මික යන අනු දර්ශක තුනෙහිම ඉහළ යාම මෙම වර්ධනය සඳහා හේතු විය.

වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත අනු දර්ශකයන්හි වැඩිම ඉහළ යාම කාර්මික ඉඩම් මිල අනු දර්ශකය මගින් වාර්තා වූ අතර එය සියයට 14.9 ක් විය. වාණිජ ඉඩම් මිල අනු දර්ශකයෙහි සහ නේවාසික ඉඩම් මිල අනු දර්ශකයෙහි ඉහළ යාම් පිළිවෙලින් සියයට 13.2 ක් හා සියයට 12.8 ක් විය. මේ අතර, ඉඩම් මිල දර්ශකය 2018 වසරේ දෙවන භාගයට සාපේක්ෂව 2019 වසරේ පළමු භාගයේ දී සියයට 5.1 කින් ඉහළ යන ලදී.

### සුවිශේෂී කාර්යසාධනයන්

| ඉඩම් මිල දර්ශක අගය | වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත වැඩිවීම |
|---|---|
| 132.2 | 13.6 % |

**අනු දර්ශකයන්හි වර්ධනය**
(වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත)

| | |
|---|---|
| නේවාසික ඉඩම් මිල අනු දර්ශකය | 12.8% |
| වාණිජ ඉඩම් මිල අනු දර්ශකය | 13.2% |
| කාර්මික ඉඩම් මිල අනු දර්ශකය | 14.9% |

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

**2017 වසරේ සිට ඉඩම් මිල දර්ශකයේ භූ ගෝලීය ආවරණය : කොළඹ දිස්ත්‍රික්කය**



**ඉඩම් මිල දර්ශකයෙහි විචලනය**




**ඉඩම් මිල දර්ශකයෙහි වර්ධනය**
**(වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත)**




මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

## ඉඩම් මිල දර්ශකය සහ වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත වර්ධනය

| **කොළඹ දිස්ත්‍රික්කය සඳහා ඉඩම් මිල දර්ශකය**<br>(පදනම් වර්ෂය: 2017 වසරේ පළමු භාගය) | **2017:** පළමු භාගය | **2017:** දෙවන භාගය | **2018:** පළමු භාගය | **2018:** දෙවන භාගය | **2019:** පළමු භාගය | **වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත වර්ධනය (සියයට)**<br>**2018: පළමු භාගය** | **වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත වර්ධනය (සියයට)**<br>**2018: දෙවන භාගය** | **වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත වර්ධනය (සියයට)**<br>**2019: පළමු භාගය** |
|---|---|---|---|---|---|---|---|---|
| නේවාසික ඉඩම් මිල අනු දර්ශකය | 100.0 | 107.0 | 116.5 | 125.0 | 131.4 | 16.5 | 16.9 | 12.8 |
| වාණිජ ඉඩම් මිල අනු දර්ශකය | 100.0 | 107.3 | 116.8 | 125.9 | 132.2 | 16.8 | 17.4 | 13.2 |
| කාර්මික ඉඩම් මිල අනු දර්ශකය | 100.0 | 106.0 | 115.8 | 126.6 | 133.0 | 15.8 | 19.4 | 14.9 |
| ඉඩම් මිල දර්ශකය | **100.0** | **106.7** | **116.3** | **125.8** | **132.2** | **16.3** | **17.9** | **13.6** |

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

### තාක්ෂණික සටහන:

#### ආවරණය සහ කාල පරාසය

ශ්‍රී ලංකා මහ බැංකුවේ සංඛ්‍යාන දෙපාර්තමේන්තුව විසින් 1998 සිට 2017 දක්වා කොළඹ දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 5 ක් ආවරණය කරමින් ඉඩම් මිල දර්ශකය සම්පාදනය කරන ලදී. ඉන් අනතුරුව, මෑත කාලීනව නිශ්චල දේපළ අංශයේ ඇති වූ වර්ධනය හේතුවෙන් ඉඩම් මිල ගණන් අධීක්ෂණය කිරීමේ වැදගත්කම වැඩි වීමත් සමඟ කොළඹ දිස්ත්‍රික්කයේ සියලු ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස ඇතුලත් වන පරිදි මෙම දර්ශකයේ භූගෝලීය ආවරණය පුළුල් කරන ලදී. මෙම නව ඉඩම් මිල දර්ශකය 2017 වසරේ සිට අර්ධ වාර්ෂිකව ගණනය කරනු ලබන අතර එහි පදනම් වර්ෂය 2017 වසරේ පළමු භාගය ලෙස සංශෝධනය කරන ලදී.

#### දත්ත මූලය

රජයේ තක්සේරු දෙපාර්තමේන්තුවෙන් අර්ධ වාර්ෂික පදනම මත ලබා ගන්නා පර්චසයක් සඳහා වන ඉඩම් මිල ගණන් මෙම දර්ශකය ගණනය කිරීම සඳහා භාවිතා කරනු ලැබේ.

#### ක්‍රමවේදය

ඉඩම් භාවිතයෙහි පවතින විවිධත්වය හේතුකොටගෙන, දර්ශකයෙහි සමජාතීත්වය පවත්වා ගැනීම උදෙසා, එක් එක් ප්‍රදේශයේ පවතින ඉඩම් පර්චසයක සාමාන්‍ය මිල උපයෝගී කර ගනිමින් සෑම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයක් සඳහාම නේවාසික, වාණිජ හා කාර්මික යන ඉඩම් කාණ්ඩ සඳහා අනු දර්ශක තුනක් වෙන් වෙන් වශයෙන් ගණනය කරනු ලැබේ. එම අනු දර්ශක තුනෙහි සාමාන්‍යය ගණනය කිරීමෙන් ඉඩම් මිල දර්ශකය සම්පාදනය කරනු ලැබේ.